

## සංචාරයක සටහන්

# ගුරු භූමිකාව හා ගෝලයා 1



**සුනිල් අබේසේකර**
**ආදි විද්‍යාර්ථී**
**කැළණිය විශ්ව විද්‍යාලය**
**නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ**
**(විශ්‍රාමික)**

මම වර්‍ෂ 1980 දි පශ්චාත් උපාධිය අවසන් කර කොළඹ විශ්ව විශ්ව විද්‍යාලයෙන් සමුගෙන උඩුගම්පොල පරණවිතාන මහ විදුහලට ස්ථාන මාරුවක් ලබා ගතිමි. වියත් අචාර්ය මණ්ඩලයක සමීප ඇසුර හා අධ්‍යාපන විද්‍යාව ගැඹුරින් හැදෑරීමට ලැබීම නිසා පාසල් දරුවන්ට ඉන් නියම ඵලයක් ලඟා කර දීමට මට වාසනවා පෑදුනි. ඒ සඳහා මාහාචාර්ය ලාල් පෙරේරා, කුලරත්න සෙනෙවිරත්න හා රූපසිංහ යන ගුර පියවරුන් ස්මරණය කිරීම මාගේ යුතුකමකි. මාගේ ගම් ප්‍රදේශය වන ගම්පහ උඩුගම්පොලට පැමිණ සුළු කලකින් මා හට ''ජාතික අධ්‍යාපන ආයතනයෙන් '' සංවිධානය කළ ''ගැටුම් නිරාකරණය, උපදේශනය හා සාම අධ්‍යාපනය, පිළිබඳව මහාචාර්ය බාලසූරිය වියතා යටතේ ගැඹුරින් හැදෑරීමට අවස්ථාවක් ලැබීමි. ඒ වන විට වියපත් වෙමින් සිටි මා ලඟා කර ගත් දැනුමෙන් යෞවනයට පත්වීමි. විදුහල් මාතාව මා සාදරයෙන් පිළිගත් අතර මම එහි සේවයට කැපවීමි.

''ගුරුවරයා ජෝන්ට අකුරු ඉගැන්වීමට පෙර ජෝන් පිළිබඳ උගතය යුතය''යන බටහිර ඉතා සළවූ ඉංග්‍රීසි කියමන සිහියට නගමින් ''ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන'' ය ඇරඹීමි. ඉතාම රහසිගතව ශිෂ්‍යයන්ගේ දුක, සැප මූලික අවශ්‍යතා හා මානසික හා පවුල් පදනම හැදෑරීමි. ඔවුන්ව යහ මඟට යොමු කිරීමට ගත හැකි සෑම ක්‍රියා මාර්ගයක්ම ගත්තෙමි. මෙම පාසලට පමණක් නොව අවට පාසල් රැසකට උපදේශන දියත් කළෙමි. ළමුන්ගේ හැකියා හඳුනාගෙන ඇතැමුන් දක්‍ෂතා අනුව උසස් අධ්‍යාපනය සඳහත් යොමු කළෙමි. අප ලද පුහුණුව අනුව 50 ට ආසන්නව සිටි ගුරු මණ්ඩලයේ කීප දෙනෙකුට ද ඔවුනට නොදැනෙන අයුරු ශූක්‍ෂම උපදේහන ක්‍රියාවේ යෙදෙමින් ඔවුන්ව ද නිසි මඟට ගැනීමට උත්සාහ දැරීම.

මේ අවදියේ ශිෂ්‍යයන්ගේ ආතතිය වේගවත් වන බව වැටහී ගියෙන් සෞදර්ය හා ක්‍රීඩා සඳහා වඩාත් යොමු කිරීමේ අරමුණෙන් වාර අවසාන විවිධ ප්‍රසංගය, පංති මට්ටමේ ප්‍රසංග මෙන්ම ලෙදර් බෝල් ක්‍රකට් ක්‍රීඩාව ආර්මහ කළෙමි. මෙහිදී විදුහල්පති ටී.එච්.එච්. පෙරේරා මහතා, දෙමව්පියන් හා රෙජී රණතුංග පවුලේ සහාය ද ලැබුණු බව මතක් කිරීම වටී. මෙවැනි අධ්‍යාපනික ශිල්පක්‍රම පාසල් තුළ ක්‍රියාත්මක කිරීම තුළින් මනෝ ''විදු ''සිග්මන් ෆ්‍රොයිඩ්'' ගේ උත්කර්ශන නයාය'' හෙවත් පුද්ගල ආතතිය මුදාහල හැකි ක්‍රම භාවිතය සාර්ථක විය. 1983 දී ලංකාවේ දෙවැනි වරට හටගත් තරුණ කැරැල්ල අප විදුහලට සෘජු බලපෑමක් ඇති කිරීමට සමත් නොවීමෙන් ඒ බව ප්‍රත්‍යක්‍ෂ විය.

මා ලඟා කරගත් ව්‍යුත්පත්ති ගුණාංගය නිසා මාගේ දරුවන් වැනි සිසු කැළ වෙත කෙමින් ආසන්න වීමි

'' මවකට සීතල දැනෙන විට ඇය තම දරුවන්ට ඇඳුම් අන්දවන්නීය''ඇම්බ්‍රෝස් බියර්ස් වියතුන්ගේ කියමන සිහියට නගමින් මම දරුවන්ගේ මූලික අවශ්‍යතා වලට ආසන්න වී, ඉටු කිරීමෙන් උත්සාහ ගත්තෙමි. ඔවුහු ද මා වටා ඒකරාශී වූහ. අප විදුහල් ගුරු මණ්ඩලයට අතින් සමාජයට බිහි වූ විවිධ ක්‍ෂේත්‍රයන්හි දැනට සිටින සිසු කැළ අතරින් වැඩි ප්‍රතිශතයක් උගතුන්ට වඩා, ගුණාංග වලින් උගත් පුද්ගලයෝ වූහ. ප්‍රසිද්ධ සංගීත වේදීහු, ගායකයෝ, බස් ධාවකයෝ, ව්‍යාපාරිකයෝ දේශපාලන ක්‍ෂේත්‍රයේ ඉහළ තනතුරු දරන්නෝ, ගුරු විදුල්පතිවරු, රාජ්‍ය සේවකයෝ, ගොවියෝ, ගෘහණියෝ අති විශාල සංඛාවක් සිටීති. මඟ තොටේදි ඔවුන්ගෙන් අප ලබන ගරු බුහුමන් නිසා වියපත් වීමේ සාපේක්‍ෂ බව අඩු වී ඇති සේය.

ළමුන්ව යහමගට යැවීමේ පිණෙන් දෝ මම නැවතත් දර්ශනපති උපාධි සඳහා කොළඹ විශ්ව විද්‍යාලයට කැඳවීව් ලැබීමි. වසර 2 ක් පාඨමාලාව හදාරා නැවතත් මෙම පාසලටම පැමිණ එහි විදුහල්පති තනතුරේ වැඩ බලමින් ඉතිරි සේවා කාලය සාර්ථකව ගෙවීම ඇරඹුවෙමි. අනතුරුව මා උසස්වීම් ලැබ මිනුවන්ගොඩ කලාපයේ අධයාපන අදියුරුව සිටින කාලයේ වර්‍ෂ 2004 දී පමණ උඩුගම්පොල විදුහලේ මා සෙවනේ සිටි ගෝලයෙක් තම බිරිඳත් කුඩා දරුවන් දෙදෙනාත් සමඟ මගේ දුක සැප බැලීමට පැමිණියේය. ඒ කපිල චන්ද්‍රරත්නය. ඔහු මගෙන් මනාව ක්‍රිකට් පුහුණුව ලත් දක්‍ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකි. මා නිදහස් කාල පරිච්ඡේද වල 6 ශ්‍රේණියේ සිට 12 ශ්‍රේණිය දක්වා පංති වලට ගොස් විවිධ මාතෘකා පිළිබඳ දැනුම ලඟා කර දීමට උත්සාහ ගත් අවස්ථාවේ ඔහු මගෙන් යමක් ලබා ගන්නට ඇත. නැතහොත් සිංහල පාඩමකට සවන් දී ඇත. එසේත් නැත්නම් සඳුදා උදෑසන මුළු පාසලම ගුරු මණ්ඩයම රැස්කර මා ඉතා සූදානම් වී අමතන දේශනයකට සවන් දී ඇත. එය අවසානයේ ළමුන්ව අමන්දනයට පත් කරන සම්භාව්‍ය ගායනයකට සවන් දී ඇත.

''සර් ට මම තෑග්ගක් ගෙනාව'' එය බූමරංගයකි. අව අටවක කාලයේ අහසේ පායන අඩි 1 1/2 ක් පමණ දිග අඟල් 2 ක් පමණ පළල දෑකැත්තක හැඩය ගත් උපකරණයකි. එය ඔස්ට්‍රේලියාවේ ආදි ග්‍රෝතිකයන් වන ඇබොජී නියන් වරු භාවිතා කළ ආයුධයක් බව පැවසේ ''මෙන්න වයින් චොක්ලට් පෙට්ටියක් '' මේවා එක්වර වැඩියෙන් ආහාරයට ගත්තොත් ටිකක් මත් වේවි'' සිනහ වෙමින් පැවසීය. ඇත්තෙන්ම මෙවැනි සුවිශේෂී තෑගි යුගලයක් මා ලත් ප්‍රථම අවස්ථාවයි. බූමරංගය අහසට ගැසූ විට එය අහසේ අර්ධ වෘත්තාකාරය කැරකී තමා වෙත ආපසු බ්‍රමණය වී එය ආකාරය ඔහු පැහැදිලි කළේය.

ඔහු විදුහලේ උසස් අධ්‍යාපනය ලබා පසුව රත්මලානේ ජර්මන් තාක්‍ෂණික උසස් අධ්‍යාපන ආයතනයට ඇතුළත්ව ඉන් පිටවී මැද පෙරදිග රටක රැකියාවක් කළ බවත්, අනතනුරුව ඔස්ට්‍රේලියාවේ රැකියා වීසා ලබා මෙල්බන් නගරයට පදිංචියට ගිය බවත් පැවසීය. වික්ටෝරියා ප්‍රාන්තයේ වෙරබි ප්‍රදේශයේ වසර කීපයක සිට පදිංචිව ඉතා සතුටුදායක ජීවිතයක් ගත කරන බවයි. අනාගතයේ කවර දින හෝ අප ඕස්ට්‍රේලියාවට පැමිණියහොත් මා හා පවුල වෙනුවෙන් සිරි නැරඹීමට දිනක් වෙන් කරන බවත්ය. මම ඔහුට එදා දුන් පිළිතුර නම් අපට ඔස්ට්‍රේලියාව වැනි දුර රටකට යාමට අවස්ථාවක් නොලැබෙන බවයි. අල්ලාප සල්ලාපයෙන් පසු ඔවුන් අපෙන් සමුගනු ලැබීය. ඔහුගේ පියා වන උගතෙකු වූ චන්ද්‍රරත්න ග්‍රාම නිලධාරී මහතා මාගේ මිත්‍රයෙකි. පසු කාලයකදී ඔහුගේ පවුලේ සැමඃ ඔවුන්ගේ පවුලේ ගුරුවරයා ලෙස මා හට ගරු සළකිලි දැක්වූහ.

අවුරුදු කිහිපයකට පසු මාගේ වැඩිමහල් දියණිය තම ස්වාමියා සමඟ ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ මර්න්ඩා වලට පදිංචිය සඳහා පැමිණියහ. අනපේක්ෂිත පරිදි වර්‍ෂ 2009 අග භාගයේදී මා බිරිඳ හා බාල දියණිය සමඟ ඕසට්‍රේලියාවට පිමිණි විගස මාගේ ගෝලයා වන කපිල චන්ද්‍රරත්ට දුරකථනයෙන් කථා කළෙමි. අපේ පැමිණීම පිළිබඳ සතුටට පත් වූ ඔවුන් අප සමඟ දිනක් ගත කරන බවට පොරොන්දු වී වෙන් වීමු.

සතියකට පමණ පසු ඔහු තම ජීප් රථයෙන් මා විසූ නිවසට පැමිණ අප තිදෙනා සමඟ පැය කීපයක් දුර ගෙවා වික්ටෝරියා ප්‍රාන්තයේ බටහිර පැත්තේ පිහිටි ජීලෝන් නැවති මුහුදුබඩ තීරයේ පිහිටි පැරණි දුම් නව් වරායක් ස්ථානගත වූ සුන්දර ස්ථානයකට රැගෙන යන ලදී. එය මීටර් 150 ක පමණ කඳු බෑවුමක පිහිටි පැරණි වරායකි. ගොඩබිමේ සිට මීටර් 100 ක් පමණ මුහුද මධ්‍යයට දිවෙන පරිදි මීටර් 3 පමණ පළලැති සිරිබරන් කොට වනි ලී කඳන් උපයෝගී කරගෙන තනූ පාලකම් විය. එම පාලමෙන් ඇතුල් වන්නේ අක්කර භාගයක් පමණ ඉඩ පහසුකම් ඇති වෘත්තාකාර වහලයක් සහිත ගොඩනැගිල්ලකටය. එහි මධ්‍යයේ පුටු හා මේස තබා ඇත. වටේට පිහාට ඇති විශාල ජනේල අතරින් පැරනි වරාය හා මුහුද දිස්වේ. මහුදු සුළං වරින් වර හමන බැවින් විඩාව සංසිදේ. එම ඉඩ පහසුකම් ඇති වටේට හා මධ්‍යයේඃ ලෝකයේ විවිධ රටවලින් සැකසූ විවිධ ආහාර සඳහා ඉතා චිත්තාකරශනීය හා සුවඳවත් රසවත් අන්දමට ඉදිරිපත් කර ඇත. ලෝකයේ පවතින මහද්වීප සියල්ලේම පාහේ පිසින ලද ආහාර වර්ග ඉදිරිපත් කර තිබුණු බව, ඒ ආහාර හඳුන්වා දීම සඳහා පසෙකින් තබා තිබූ දැන්වීම වලින් දැන ගත හැකි විය. මේ අතර ඇතැම් මාළු, මස්, එළවළු වර්ග කීපයක් නොපිසා අබ විනාකිරි මිශ්‍රිත සෝස් වර්ගයක් සමග අනුභවයට ගන්නා බව චන්ද්‍රරත්න අප සමඟ පැවසීය. අනෙක් පස සම්පූර්ණයෙන් පිරී තිබුනේ විවිධ අතුරුපස වලිනි. එම ස්ථානය හැඳින්වූයේ ''ස්මූගීස්'' බුෆේ නමිනි. එක් අයෙක් සඳහා ඔස්ට්‍රේලියානු ඩොලර් 30 ක ටකට් පතක් මිලදී ගත් විට (රු. 3000/-) දිවා ආහාරය කාලය තුල තමන්ට හැකි පමණ ආහාර අනුභව කළහැකිය.

මේ ස්ථානයට බොහෝ දුරට කැටුව යන්නේ අහාර වැඩි ප්‍රමාණයක් අනුභව කළහැකි අය බව ඔහු පැවසීය. අපත් ඒ සඳහා සපුබට නොවූ බව සඳහන් කළ යුතුය. එහි මනාව සප්පායන් වීමෙන් පසු ඊට නුදුරින් පිහිටි මුහුදු වෙරළෙහි අපූර්ව ළමා උයනක් තනා තිබුණි. අඩි 100 ක් පමණ උස්වූ කතුරු ඔන්චිල්ලාවක් ද විය. මුහුදේ දිය නෑම සඳහා ආරක්ෂිත දැලකින් වෙන්වූ කුඩා ප්‍රදේශයක් ද විය. දිලෙන් ආරක්ෂිත දැලකින් වෙන්වූ කුඩා ප්‍රදේශයක් ද විය. දැලෙන් ආරක්‍ෂා කර තිබුණෝ මිනීමරු මෝරුන්ගෙන් ගහන ප්‍රදේශයක් නිසා බව චන්ද්‍රරත්න අපට පැහැදිලි කර දෙන ලදී. එහි හෝරාවක් දෙකක් ගත කළ අපි සවස් භාගය වන විට වෙරබි පෙදෙසේ පිහිටි මාගේ ගෝලයාගේ නිවසට විත් රාත්‍රී ආහාරය ද ගෙන ආපසු පැමිණියෙමු.

**මතු සම්බන්ධයි**

**සංස්කරණය**
**තිශාලී අබේසේකර**
මර්න්ඩා විලේජ්, වික්ටෝරියා.